**ශීර්ෂය 112 - විදේශ සබඳතා අමාත්‍යාංශය**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

විදේශ සබඳතා අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට විදේශ සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 ඡේදයේ ඇතුළත් නිරීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුළත් වෙනත් ලැබීම් රු.2,731,432,749 ක් වුවද, ශේෂ පිරික්සුමට අනුව එම අගය රු. 2,667,247,127 ක් විය. ඒ අනුව වෙනස රු. 64,185,622 ක් විය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුලත් වෙනත් ලැබීම් භාණ්ඩාගාර ශේෂ පිරික්සුම සමඟ සැසඳීමේදී වෙනස්කම් නොපැවතිය යුතු බව. | සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් වෙනත් ලැබීම් රු.2,731,432,749 ක් වුවද, ශේෂ පිරික්සුමේ වෙනත් ලැබීම් රු. 2,667,447,127 ක් වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද එම ශේෂයට භාණ්ඩාගාරය විසින් ඇතුලත් කරන ලද අවසන් ජර්නල් සටහන් රු. 20,217,163 ක ගැලපීම හා 35-18 අග්‍රිම ගිණුමට ජර්නල් සටහන් මඟින් කරන ලද රු. 43,730,296 ක ගැලපීම කිරීමෙන් පසුවත්, රු.238,163 ක වෙනසක් පවතියි. |

**1.6.2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේදී දූත මණ්ඩල 03ක අපහරණය කරන ලද පිරිවැය වටිනාකම රු. 13,875,228 ක් වූ වාහන 03ක විකුණුම් වටිනාකම රු. 2,156,731 ක් අපහරණය අගය ලෙසත්, තවත් අපහරණය කරන ලද වාහන 02ක පිරිවැය වටිනාකම රු. 7,648,500 ක් ඇතුළත් නොකර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අපහරණ වටිනාකම දක්වා තිබුණි. අපහරණය කරන ලද වාහන 05 සඳහා වූ රු. 19,366,997 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂයෙන් අඩුකර නොතිබුණි. | අපහරණය කරන ලද වාහන 05 සඳහා රු. 19,366,997 ක් වූ වටිනාකම ද අපහරණ අගය ලෙස හඳුනා ගත යුතු බව. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේ වැඩපිළිවෙල යටතේ මෙම ගැටළුව විධිමත් පරිදි නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**1.6.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ශේෂ ඇතුලත් කළ යුතු බව. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දක්වා නොමැති බව පිළිගන්නා බව. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ මාසික ගිණුම් සාරාංශවලට අනුව මුදලින් තැන්පතු ලැබීම් හා | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස මුදලින් ලද තැන්පතු ලැබීම් හා ගෙවීම් ඇතුලත් විය යුතු බව. | ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර අවසන් ගිණුම් අනුව තැන්පතු ලැබීම් හා ගෙවීම් දක්වා ඇති බව. |

තැන්පතු ගෙවීම් පිළිවෙලින් රු. 2,184,223,119 ක් හා රු.2,107,779,187 ක් වුවද, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස පිළිවෙලින් රු.2,332,843,654 ක් හා රු. 2,226,489,422 ක් ලෙස දක්වා තිබුණි.

**1.6.4. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව විදේශ දූත මණ්ඩල සම්බන්ධයෙන් හානි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු බව. | ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම විය. එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 13 | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළ යුතු බව. | වර්ෂය තුල භාණ්ඩාගාරය විසින් දෙන ලද උපදෙස් අනුව කටයුතු කිරීමට සිදුවීම මත වියදම් පාලනය කිරීම, විශාල ප්‍රමාණයේ අලුත්වැඩියා ඇති නොවීම, වර්ෂය තුල අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යධූරය වරින් වර පුරප්පාඩුව පැවතීම නිසා අපේක්ෂිත වියදම් ඇති නොවීම, තවද දූත මණ්ඩල 67 හි පවතින සංකීර්ණත්වය, අවශ්‍යතාවල විවිධත්වය සහ අඛණ්ඩව විනිමය උච්චාවචනයන්ට භාජනය වීම නිසා වන බලපෑම මත වියදම් නිශ්චිතව |

| | | |
|---|---|---|
| ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 51ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් මුළු වටිනාකම රු.441,019,627 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. තවද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන්ට අමතරව වැය විෂයයන් 06 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. 344,510,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. | | පුරෝකතනය කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඌන උපයෝජනය වීම.සමහර වැය විෂයයන් වලට අදාල වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදන භාණ්ඩාගාරය මුල් ඇස්තමේන්තුවෙන් ලබා නොදීම, වර්ෂය තුල විදේශ විනිමය අනුපාතය උච්චාවචනයවීම, ජාත්‍යන්තර සංවිධානවලට ගෙවිය යුතු වාර්ෂික ගාස්තු වැඩිවීම. 2019 ජනවාරි 01 දින සිට මූලික වැටුප් වැඩිවීම, දූත මණ්ඩලවල පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කිරීම හා ඒ වෙනුවට නිලධාරීන් මෙරටට කැඳවීම යන කරුණු පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වැඩි කර ගැනීමට හේතු විය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම
--------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------------- | නිර්දේශය<br>----------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයයන් 30ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය වූ එකතුව රු. 7,716,246 ක ප්‍රතිපාදනය රු. 81,835,422 කින් ඉක්මවා රු. 89,551,668 ක බැරකම් වලට එළඹ තිබුණි. | ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා බැරකම් ඇති කර නොගත යුතු බව . | මෙම බැරකම් ප්‍රමාණය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය දැනුවත් කරන අතර මෙම බැරකම් ප්‍රමාණය අමාත්‍යාංශයේ මුලු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.7 ක් පමණ වේ. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ)දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරකම් ශේෂය රු. 365,063,523 ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂ 02 ක සිට වර්ෂ 28 ක් දක්වා වූ කාල පරාසයක ශේෂය රු. 301,986,504 ක් විය. | ආරක්ෂිත ඇප තැන්පතු පමණක් නොව නිලධාරීන්ට ගෙවූ අත්තිකාරම් මුදල් ද ඇති බැවින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | විදේශ දූත මණ්ඩලවල ගොඩනැගිලි කුළී පදනම මත ලබා ගැනීමේදී ගෙවිය යුතු ආරක්ෂිත ඇප තැන්පතු මුදල් අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර ඇත.මෙම මුදල් නැවත අයකර ගත හැකි වන්නේ පදිංචියෙන් ඉවත් වූ පසුවය. මෙම ශේෂය අත්තිකාරම් ලෙස වාර්තා කර ඇති අතර භාණ්ඩාගාර උපදෙස් මත මෙය වාර්තා කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීමට කටයුතු කරමින් පවතියි. |
| (ආ)රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම | | |
| (i) 2019 දෙසැම්බර් 31 දිනට මියගිය, වැඩ තහනම් වූ, සේවය අවසන් කල හා සේවය හැර ගිය නිලධාරින්ගේ හිඟහිටි ණය ශේෂවල එකතුව රු. 2,036,618 ක් වූ අතර ඉන් වර්ෂ 05 ට වඩා පැරණි හිඟ ණය ශේෂවල එකතුව රු. 1,167,642 ක් විය. | හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 5ට වැඩි ණය ශේෂය රු.1,221,992 ක් වන අතර එම ණය මුදල 2019 දෙසැම්බර් 31 දින වන විට රු.1,167,342 දක්වා අඩු කර ගැනීමට කටයුතු කරන ලදී. |
| (ii) වර්ෂ 05 කට වැඩි හඳුනා නොගත් එකතුව රු. 1,515,668 ක ණය ශේෂයන් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරීන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | මෙම ණය ශේෂයන් කාලයක සිට පැවතෙන බැවින් එම ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා භාණ්ඩාගාරය වෙත දැනුම් දී ඇති අතර ඉදිරියේදී එම ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතියි. |

## 2.4 තැන්පතු ශේෂයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)තැන්පතු ගිණුම් 05 ක භාණ්ඩාගාර ශේෂයන් හා අමාත්‍යාංශ පොත් අනුව ශේෂයන් අතර රු. 4,521,095 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂයන් හා අමාත්‍යාංශ පොත් අනුව ශේෂයන් අතර වෙනසක් නොපැවතිය යුතු බව. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ)මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පිළියෙල කල මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයන් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පතු ගිණුම්වල වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු රු. 8,851,391 ක් හා දූත මණ්ඩලවල වර්ෂ 02 ක් ඉක්මවූ ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් රු.28,498,689 ක් විය. | වර්ෂ 02 ඉක්මවූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | දූත මණ්ඩල 67 ක තොරතුරු එක් රැස් කර අමාත්‍යාංශය වශයෙන් තනි පොදු තැන්පත් ගිණුමක් තුලනය කිරීම මාසිකව සිදු කිරීමට අපහසු වේ. එබැවින් අර්ධ වාර්ෂිකව සැසඳීම් කිරීමට කටයුතු යොදා ඇති බැවින් 2020 ජූනි 30 දිනට ගිණුම සැසඳීමෙන් අනතුරුව වසර 02 ඉක්මවූ ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රගතිය වාර්තා කරන බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රංශයේ පැරිස් සහ රුසියාවේ මොස්කව් තානාපති කාර්යාලවල 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එහි ඇතුලත් විය යුතු මූලික අංගයන් වූ අරමුදල් වෙන් කිරීම්, මාසික හෝ කාර්තු ආදි වශයෙන් අපේක්ෂිත ඉලක්කයන්, මෙම ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා වගකිව යුතු නිලධාරීන් ආදි තොරතුරු මෙහි ඇතුලත්ව නොතිබුණි. එසේම නිලධාරීන්ගේ කාර්යසාධනය මැනීම සඳහා මිනුම් දණ්ඩක් ලෙස ක්‍රියාකාරි සැලැස්ම පිළියෙලකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එහි අඩංගු විය යුතු කරුණු ඇතුලත්ව පිළියෙල කළ යුතු බව. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රුසියාවේ මොස්කව් තානාපති කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නොමැති බැවින් වර්ෂය තුල මිලදී ගත් ප්‍රාග්ධන භාණ්ඩ හදුනා ගැනීමට කටයුතු කරනුයේ වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණ සිදු කරන අවස්ථාවේදීය. | ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගන්නා අවස්ථාවේදී ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුලත් කළ යුතු බව. | අදාල ක්‍රමවේදයන්ට අනුව කටයුතු කරනු ලබන බව. |

| | | |
|---|---|---|
| (ආ) පෞරාණික ගොඩනැගිල්ලක කොටසක ප්‍රංශයේ පැරිස් දූත මණ්ඩල කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. එම හේතුවෙන් කොන්සියුලර් කටයුතු සඳහා පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ට පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක් මෙන්ම වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් ඇති ස්ථානයක් අත්පත් කරගැනීම වඩා ඵලදායි බව නිරීක්ෂණය විය. | දූත මණ්ඩල කාර්යාලය පිහිටි ස්ථානය සඳහා දැනට වාර්ෂික කුලී වියදම රු.මිලියන 60ක් (යුරෝ 286,189ක) ගෙවනු ලබයි. මේ සඳහා සුදුසු දේපලක් අත්පත් කර ගැනීමේ හැකියාව පිළිබඳව විමසා බැලිය යුතු බව. | සුදුසු දේපලක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කරනු ලබන බව. |
| (ඇ)රුසියාවේ මොස්කව් තානාපති කාර්යාලය සහ තානාපති නිල නිවස පිහිටා ඇත්තේ රුසියානු රජයට අයත් පෞරාණික ගොඩනැගිල්ලකය. මෙම ගොඩනැගිල්ලේ විශාල අලුත්වැඩියාවන් කළ යුතු බව රුසියානු රජය හඳුනාගෙන ඇති අතර ඒ අනුව මෙම ගොඩනැගිල්ලෙන් ඉවත්ව අදාල අලුත්වැඩියාවන් සිදුකරන තෙක් රජය විසින් සපයා දෙනු ලබන තාවකාලික ගොඩනැගිල්ලකට යායුතු බව රජය වෙනුවෙන් එරට විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දැනුම් දී තිබුණි. එසේ වුවද තානාපති කාර්යාලය තම අවශ්‍යතාවය සම්බන්ධයෙන් රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශයට දන්වා නොතිබුණි. | දේපල අත්පත් කර ගැනීමේ හැකියාව පිළිබඳව විමසා බැලිය යුතු බව. | දේපලක් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් උපදෙස් ලබා දී ඇති බව. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේදී විදේශ දූත මණ්ඩලවල දූත මණ්ඩල කාර්යාල , දූත මණ්ඩල ප්‍රධානි නිල නිවාස සහ අනෙකුත් කාර්ය මණ්ඩල නිවාස කුලි පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සඳහා වාර්ෂික කුලිය ලෙස රු.මිලියන 1,720 ක් අමාත්‍යාංශයට දැරීමට සිදුවී තිබුණි. එයට පිළියමක් ලෙස මූල්‍යමය වශයෙන් වාසිදායකවන ආකාරයෙන් දූත මණ්ඩල සඳහා දේපල අත්පත්කර ගැනීමට අමාත්‍යාංශ සැලැස්මක් සකස්කර නොතිබුණි. | දූත මණ්ඩල පරිශ්‍ර සහ දූත මණ්ඩල ප්‍රධානි නිල නිවාස සහ අනෙකුත් කාර්ය මණ්ඩල නිවාස සඳහා වාර්ෂිකව දැරීමට සිදුවන වියදම අවම කර ගැනීම සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු බව. | අධික වාර්ෂික නිවාස කුලි මුදලක් වැයවන දූත මණ්ඩල ප්‍රධානි නිල නිවාස හා කාර්යාල ගොඩනැගිලි මිලදී ගැනීම පළමු පියවර යටතේ සිදු කිරීමට සැලසුම් කර ඇත. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රංශයේ පැරිස් තානාපති කාර්යාලයේ මු.රෙ 880 ප්‍රකාරව මුදල් පරිහරනය කරන නිලධාරීන් සම්බන්ධව ඇප ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තබා ගත යුතු බව. | අමාත්‍යාංශයෙන් විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. |

**3.4 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)විදේශ දූත මණ්ඩල සම්බන්ධයෙන් පාඩු හා අත්හැරීම් සිද්ධීන් 48 ක වටිනාකම රු.27,394,194 ක් විය.එම ශේෂයෙන් වර්ෂ 10ක් ඉක්ම වූ හා වර්ෂ 05ත් වර්ෂ 10ත් අතර, ශේෂයන් පිළිවෙලින් රු.1,334,669 ක් හා රු.21,626,285 ක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කර නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බව. | තානාපති කාර්යාල මඟින් මෙම සිද්ධීන් වලට අදාල තොරතුරු කැඳවා මු.රෙ 106 හා මු.රෙ 113 ප්‍රකාරව කටයුතු කරමින් පවතියි. කාල විශ්ලේෂණය අනුව ප්‍රමුඛතා පදනම මත කඩිනමින් නිම කිරීම සඳහා අදාල අංශ දැනුවත් කිරීමට කටයුතු සටහන් කර ගන්නා ලදී. |
| (ආ)මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල් අයථා පරිහරණ සොරකම් හා වැටුප් රහිත නිවාඩුවලින් අයවිය යුතු රු. 17,200,287 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කර නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන වර්ෂ 11 ක සිට ඉදිරියට එමින් පැවතුනි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කර නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. | රෝම තානාපති කාර්යාලයේ මුදල් සොරකම් වලට අදාලව නිලධාරීන්ගේ වැඩ තහනම් කර ඇති අතර ඒ සම්බන්ධව දැනට කොළඹ මහාධිකරණයේ නඩු දෙකක් පවරා ඇති අතර මේ වන විට විභාග වෙමින් පවතී.ඉතිරි මුදල් සොරකම් සම්බන්ධව හා වැටුප් රහිත නිවාඩු වලින් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඇ)නිවාස ආරක්ෂිත ඇප තැන්පතු රු. 2,166,472 ක් වාහන අනතුරු රු. 3,752,431 ක් අයකර ගත නොහැකි අත්තිකාරම් රු. 1,750,081 ක්, ජංගම දුරකථන නැතිවීම් රු. 16,000 ක්, හා වාහන සොරකම් ,පරිගණක , වෙනත් හානි සම්බන්ධයෙන් රු.2,277,614 ක මුදලක් නිරවුල් කිරිමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් යටතේ දිගින් දිගටම පෙන්වා තිබුණි. | නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බව. | මෙම අලාභ හානි පිලිබඳව තව දුරටත් සොයා බලා නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------------- | --------------- | ---------------------------------- |
| (අ) 2015 ජූලි 23 දිනැති අංක 7/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 11,12 වගන්ති හා 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ සියළුම දායක දායිකාවන්ගේ ගිණුම්වල ඇති අනිවාර්ය දායක මුදලට සහ රජයේ ප්‍රසාද මුදලට වැල් පොලියක් හිමිවිය යුතුයි. එම විධානවලින් බැහැරව ටොරෙන්ටෝ කන්සියුලර් ජනරාල් කාර්යාලයේ සන්නිවේදන සහකාර නිළධාරියෙකුගේ 2008 අගෝස්තු සිට 2018 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වූ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ රජයේ ප්‍රසාද මුදල වූ රු. 2,861,331 ක මුදල සහ කළමනාකරණ සේවයේ නිලධාරීනියකගේ 2014 ජූනි සිට 2018 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වූ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ රජයේ ප්‍රසාද මුදල රු.1,411,660 ක මුදල | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට (PSPF) අනිවාර්ය දායකමුදල් (8%) සහ රජයේ ප්‍රසාද මුදල (12%) සඳහා වූ දායක මුදල් මාසිකව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු බව. | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට කෙරෙන දායක මුදල් අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකර යැවීම දූත මණ්ඩලය විසින් අඩුකර යැවීම ප්‍රමාද කර ඇති බව නිරීක්ෂණය වූ විගස අමාත්‍යාංශය විසින් දූත මණ්ඩලය දැනුවත්කර එය නිවැරදි කිරීමට පියවර ගන්නා ලදී. මේ පිලිබඳව තවදුරටත් අවධානය යොමු කර කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව . |

| | | |
|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුනේ 2019 මාර්තු මාසයේ දී ය. එම හේතුවෙන් හිමිවිය යුතු වැල් පොළිය අහිමි වී තිබුණි. | | |
| (ආ)ගෙවීම අනුමත කිරීම තානාපති කාර්යාලයේ ප්‍රධානියා විසින් සිදුකළ යුතු වුවද බොහෝ අවස්ථාවලදී මොස්කව් තානාපති කාර්යාලයේ ගෙවීම් අනුමත කිරීම සිදුකර තිබුණේ තානාපති කාර්යාලයේ පළමු ලේකම් හෝ උපදේශක (Counsellor) විසිනි. | 2019 ජනවාරි 04 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව වියදම් අනුමත කිරීම, සහතික කිරීම,හා ගෙවීම සිදුවිය යුතු බව. | නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) 1986 සිට 2018 සැප්තැම්බර් දක්වා කාලය තුල සංස්කෘතික විද්‍යාත්මක හා තාක්ෂණික ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ශ්‍රී ලංකා රජය රුසියානු ජනරජය සමඟ ද්විපාර්ශවික ගිවිසුම් 20ට එළඹ තිබුණි. එහෙත් එම ගිවිසුම් මඟින් අපේක්ෂිත අරමුණු හා ඉලක්ක කරා ළඟාවූයේ ද යන බව අදාල රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන පසු විපරම් කිරීමට දූත මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | එකඟ වී ඇති ගිවිසුම් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කළ යුතු බව. | ගිවිසුමේ කටයුතු සොයා බැලීමට පත්කළ ඇති නිලධාරීන් අදාල රුසියානු නියෝජිත ආයතන සමඟ ගිවිසුම සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබන බව. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු හා අතිරික්ත සංඛ්‍යාව පිළිවෙලින් 69ක් හා 11ක්ද, දූත මණ්ඩල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 127ක්ද බව නිරීක්ෂණය විය. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව. | බඳවා ගැනීම් අවස්ථාවන්වලදී පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් අයදුම්කරුවන් පත්නොවීම නව අංශ ගණනාවක් පිහිටුවා ඒ සඳහා අංශ ප්‍රධානීන් පත්කිරීම යන කරුණු පුරප්පාඩු හා අතිරික්තතා ඇතිවීමට හේතුවී ඇති අතර දූත මණ්ඩලයන්හි ඇතිවන පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබුවත් යම් යම් අවහිරතා නිසා පුරප්පාඩු ඇතිවූ සැනින් පිරවීම සිදුකිරීමට නොහැකි වීම දූත මණ්ඩල පුරප්පාඩු ඇතිවීමට හේතු වී ඇත. |